සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

උපදෙස් :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් 1 සිට 3 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

හිරුණි තම නිවසේ කොටසක පාවහන් සකසා විකුණන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර සහායට සකිඳු නමැති සේවකයෙකු ද බඳවා ගෙන ඇත. හිරුණි තම ව්‍යාපාරය ''හිරු ෂූස්'' ලෙස ලියාපදිංචි කරන ලදී.

01. ''හිරු ෂූස්'' සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
    (1) විනෝදාස්වාදය (2) පාවහන් (3) ආරක්ෂාව (4) ඇඳුම්

02. සකිඳු අයත්වන නිෂ්පාදන සාධකය කුමක් ද?
    (1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසාය

03. ''හිරු ෂූස්'' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් වන හිරුණිගේ අරමුණක් නොවන්නේ,
    (1) ආයෝජනයේ සුරක්ෂිතතාව. (2) ප්‍රමාණවත් ලාභයක් ලබා ගැනීම.
    (3) රැකියා සුරක්ෂිත බව. (4) ව්‍යාපාරයේ අනාගත වර්ධනය.

04. ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ තීරණ ක්‍රියාත්මක කරන පාර්ශවය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
    (1) ව්‍යවසායකයෝ (2) සේවකයෝ (3) සැපයුම්කරුවෝ (4) කළමනාකරුවෝ

05. පහත ''X'' තීරුවේ ඇල්මැති පාර්ශවය ද, ''Y'' තීරුවේ ව්‍යාපාර සඳහා වන දායකතවය සඳහා නිදසුන් ද දක්වා තිබේ.

''X'' තීරුව	''Y'' තීරුව
(1) අයිතිකරුවෝ	A. ව්‍යාපාර සඳහා හිතකර දිරිගැන්වීම් ලබා දීම.
(2) සේවකයෝ	B. කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම.
(3) රජය	C. ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුව හා කැපවීම.
(4) සැපයුම්කරුවෝ	D. ශ්‍රම ඵලදායිතාවය වැඩි කිරීම.

ඉහත ''X'' තීරුවේ ඇල්මැති පාර්ශවය ''Y'' තීරුවේ ව්‍යාපාර සඳහා වන දායකත්වය සමඟ නිවැරදිව ගලපා ඇති අනුපිළිවෙල වන්නේ,
    (1) DCAB (2) CDBA (3) CDAB (4) DCBA

06. පහත දැක්වෙන ව්‍යාපාර පරිසරාත්මක සංරචක අඩංගු පිළිතුරු අතරින් ආර්ථික පරිසරයට පමණක් අයත් වන සංරචක අඩංගු පිළිතුර තෝරන්න.
    (1) ඉතුරුම්, පොලී අනුපාත, ජාත්‍යන්තර සබඳතා, ආදායම් ව්‍යාප්ති.
    (2) පොලී අනුපාත, අයවැය ප්‍රතිපත්ති, ඉතුරුම්, ආදායම් ව්‍යාප්ති.
    (3) ඉතුරුම්, පොලී අනුපාත, අයවැය ප්‍රතිපත්ති, උද්ධමනය.
    (4) පොලී අනුපාත, ඉතුරුම්, ජාත්‍යන්තර සබඳතා, යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රතිපත්ති.

07. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් අයත් වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?

(1) දේශපාලන පරිසරය. (2) නෛතික පරිසරය. (3) සැපයුම්කරුවෝ. (5) ගනුදෙනුකරුවෝ.

08. තාක්ෂණික පරිසරය ශීඝ්‍රයෙන් වර්ධනයට බලපැන්නේ,

(1) ව්‍යාපාර පරිසරය හා අන්තර්ජාලය. (2) නිෂ්පාදන ක්‍රමවල දියුණුව හා ප්‍රවාහන තාක්ෂණය.

(3) නව සොයාගැනීම් හා නව නිර්මාණ. (4) පුද්ගල ජීවන රටාව හා පුද්ගල ආදායම.

09. පහත ''X'' තීරුවේ සාධක ''Y'' තීරුව සමඟ ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

''X'' තීරුව	''Y'' තීරුව
(1) සරල අත්යන්ත්‍ර	A විද්‍යුත් තැපෑල
(2) සාමාන්‍ය තැපෑල	B විද්‍යුත් තැපැල් ලිපිනය
(3) ගිණුම් සටහන්	C අති නවීන යන්ත්‍ර සූත්‍ර
(4) තැපැල් ලිපිනය	D පරිගණක හා තොරතුරු පද්ධති

(1) DBCA (2) DACB (3) CBDA (4) CADB

10. ගෝලීයකරණය යන්න වඩාත් නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ,

(1) ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් අන්‍යෝන්‍ය බැඳීම.

(2) රටවල් අතර නිදහසේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම.

(3) භාණ්ඩ හා සේවා නිදහසේ හුවමාරු වීම.

(4) ගෝලීය පරිසරයේ විවිධ සාධක වල වෙනස් වීම.

11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණු වීම හේතුවෙන්,

(1) ව්‍යාපාර කටයුතු කිරීමට හැකියාව ලැබීම.

(2) මුළු ලෝකයම එකම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත.

(3) ගෝලීය පරිසරය වෙනස් නොවීම.

(4) මිනිස් ශ්‍රමයට පමණක් හුවමාරු වීම.

12. හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර සංවිධාන වර්ග වී ඇති ආකාරය වන්නේ,

(1) රාජ්‍ය අංශය හා පොදු අංශය. (2) අරමුණ අනුව හා පරිමාණය අනුව.

(3) පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය. (4) ඒක පුද්ගල ව්‍යාපාර හා සමිති සංවිධාන.

13. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන පමණක් අඩංගු නිවැරැදි පිළිතුර වන්නේ,

(1) රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථා, සමුපකාර සමිති.

(2) සංස්ථාපිත සමාගම්, සමිති සංවිධාන, රාජ්‍ය සමාගම්.

(3) රාජ්‍ය දෙපාර්තමේන්තු, සමුපකාර සමිති, සමිති සංවිධාන.

(4) රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම්.

14. ව්‍යාපාර සංවිධානයක පරිමාණය විවිධ නිර්ණායක මත තීරණය කරනු ලැබේ. ප්‍රමාණාත්මක නිර්ණායකයක් වන්නේ,

(1) ව්‍යාපාරයට ඇති වෙළෙඳපොල කොටස. (2) භාවිතා කරන තාක්ෂණය.

(3) ව්‍යාපාරයේ ස්වභාවය. (4) සේවක හා කළමණාකරණ දක්ෂතා.

15. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේනතුව හඳුන්වා දෙන පරිදි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් යනු,

(1) අඩු ප්‍රාග්ධනයක් සහිත ව්‍යාපාර. (2) වෙළඳපොල කොටස කුඩා වූ ව්‍යාපාර.

(3) කුඩා තාක්ෂණයක් භාවිතා කරන ව්‍යාපාර. (4) සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර.

16. ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් පදනම් වේ. සමාජ සුභ සාධනය අරමුණු කරගත් ව්‍යාපාර සවිධානයක් වන්නේ,

(1) සංස්ථාපිත සමාගම් (2) සමූපකාර සමිති (3)රාජ්‍ය සමාගම් (4) හවුල් ව්‍යාපාර

17. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනත් මගින් රාජ්‍ය සංස්ථා ආරම්භ කෙරෙයි. රාජ්‍ය සංස්ථා සඳහා නිදසුනක් නොවන්නේ,

(1) පොල් සංවර්ධන අධිකාරිය. (2) කෘෂි රක්ෂණ මණ්ඩලය.

(3) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව. (4) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.

18. වත්කමක දැකිය හැකි ලක්‍ෂණයක් නොවන්නේ,

(1) අතීත ගනුදෙනුවක හා සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.

(2) ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.

(3) වර්තමානයේ බැඳීමක් පැවතීම.

(4) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

19. ජංගම නොවන වත්කමක් සඳහා උදාහරණයකි.

(1) ණය ගැතියෝ (2) ආයෝජන පොලී ආදායම් (3) මුදල් (4) දිගු කාලීන ආයෝජන

20. පහත දැක්වෙන්නේ ව්‍යාපාරික ගනුදෙනුවකි.

''අයිතිකරු රු. 5000 පිරිවැය වූ භාණ්ඩ තොගයක් තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.''

ඉහත ගනුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට බලපෑම නිවැරදිව දැක්වෙන්නේ,

(1) වත්කම් අඩුවීම, වත්කම් අඩුවීම. (2)වත්කම් අඩුවීම, වගකීම් අඩුවීම.

(3) හිමිකම් අඩුවීම, වගකීම් වැඩිවීම. (4)වත්කම් අඩුවීම, හිමිකම අඩුවීම.

21. ව්‍යාපාරයක හිමිකම වැඩිවීම සඳහා බලපාන ගනුදෙනුවක් වන්නේ,

(1) ණය ගැතියෙකුගෙන් රු. 5000/= මුදලක් ලැබීම. (2) රු. 75 000/= බැංකුවට ණය වාරිකයක් ගෙවීම.

(3) රු. 50 000/= ක තොගයක් විනාශ වීම. (4) රු. 100 000/= විකුණුම් ආදායම් ලෙස ලැබීම.

22. තිළිණ ගේ ව්‍යාපාරයේ 2023 / 03 / 01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
500 000	=	450 000	+	50 000

2023 / 03/ 03 දින සිදු වූ ගනුදෙනුවෙන් පසු ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වෙනස් විය.

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
500 000	=	475 00	+	25 000

මෙදින සිදු වූ ගනුදෙනුව විය හැක්කේ,

(1) රු 25 000 ක් ණය හිමියන්ට ගෙවීම.

(2) රු 25 000 ක් බැංකු ණය පොලී ගෙවීම.

(3) අයිතිකරු තම පෞද්ගලික මුදලින් රු. 25 000/= ක ණය හිමියන් පියවීම.

(4) රු 25 000/= විදුලි වියදම් ගෙවීම.

23. හිමාෂාගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

බැංකු ශේෂය	=	රු. 50 000/=
මුදල් ශේෂය	=	රු. 75 000/=
ගොඩනැගිලි	=	රු. 250 000/=
ණය හිමියෝ	=	රු. 55 000/=
බැංකු ණය	=	රු. 300 000/=
තොගය	=	රු. 65 000/=

ඉහත තොරතුරු වලට අනුව හිමාෂාගේ ව්‍යාපාරයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් වල අගය පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) 440 000, 370 000 (2) 190 000, 55 000 (3) 190 000, 70 000 (4) 440 000, 70 000

24. සෙව්වන්දිගේ ව්‍යාපාරයේ 2023 වර්ෂයට අදාළ පහත තොරතුරු ඔබට දී ඇත.

2023 / 01 / 01 දිනට ප්‍රාග්ධනය	රු. 700 000
වර්ෂයේ මුළු ආදායම	රු. 75 000
වර්ෂයේ මුළු වියදම	රු. 25 000
වර්ෂය තුළ සිදුකළ ගැනිලි	රු. 15 000

2023 / 12 / 31 දිනට අයිතිකරුගේ හිමිකම දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

(1) රු. 750 000/= (2) රු. 735 000/= (3) රු. 765 000/= (4) රු. 685 000/=

25. ගිණුම්කරණයේ දී ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැකි අවස්ථාව මින් කවරදක් ද?

(1) රු. 10 000/= ක සේවක වැටුප් ගෙවීම. (2) ආයතනයේ සේවක මණ්ඩලය 500 කි.

(3) විකුණුම් ආදායම රු. 50 000/=. (4) ණය ගැතියෙකුගෙන් රු. 15 000/= ක මුදලක් ලැබීම.

26. ලෙජරයේ දැකිය හැකි වත්කම් හා වියදම් ගිණුමට උදාහරණයකි.

(1) මුදල් ගිණුම, ගැනිලි ගිණුම. (2) රක්ෂණ ගාස්තු ගිණුම, විදුලි වියදම් ගිණුම.

(3) ණයගැති ගිණුම, විදුලි වියදම් ගිණුම. (4) ගැනුම් ගිණුම, පොලී ආදායම් ගිණුම.

27. වැරදි පිළිතුර තෝරන්න.

	ගිණුම් වර්ගය	වැඩි වීම	අඩුවීම
(1)	විකුණුම් ගිණුම	හර	බැර
(2)	කුලී වියදම් ගිණුම	හර	බැර
(3)	බැංකු ණය ගිණුම	බැර	හර
(4)	මුදල් ගිණුම	හර	බැර

28. ''අ'' කොටස හා ''ආ'' කොටස නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

''අ''	''ආ''
(1) ගැනිලි ගිණුම	A වත්කම් ගිණුමකි.
(2) රක්ෂණ ගාස්තු ගිණුම	B ආදායම් ගිණුමකි.
(3) කොමිස් ආදායම් ගිණුම	C විදයම් ගිණුමකි.
(4) මෝටර් රථ ගිණුම	D හිමිකම් ගිණුමකි.

(1) DCBA (2) CDBA (3) ACDB (4) DACB

29. රු. 150 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීමට අදාළ ගනුදෙනුව සටහන් කිරීමේ නිවරදි ද්විත්ව සටහන තෝරන්න.

(1) ගැනුම් ගිණුම - හර 150 000
ණයගැති ගිණුම - බැර 150 000

(2) ගැනුම් ගිණුම - හර 150 000
ණයහිමි ගිණුම් - බැර 150 000

(3) ණයහිමි ගිණුම - හර 150 000
ගැනුම් ගිණුම - බැර 150 000

(4) ණයගැති ගිණුම - හර 150 000
ගැනුම් ගිණුම - බැර 150 000

30. ව්‍යාපාරයක ගනුදෙනුවක් සිදු වූ අවස්ථාවේ ම එහි සියලු විස්තර ඇතුල් කර සකසන ලද ලේඛනය,

(1) මූලාශ්‍ර ලේඛනය වේ. (2) මූලික සටහන් පොත වේ.

(3) මුදල් පොත වේ. (4) ලදු පත වේ.

31. පාවහන් අලෙවි සැලක් පවත්වාගෙන යන විසල් විසින් 2023 / 6 / 17 දින නැවත විකිණීමේ අරමුණින් රු. 75 000/= ක පාවහන් තොගයක් ''ධනා ෂු පැලස්'' ආයතනයෙන් මිලදී ගෙන ඇත. මෙම ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛණය හා මූලික පොත පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) ගැනුම් ජ'නලය, ගැනුම් ඉන්වොයිසිය. (2) ගැනුම් ජ'නලය, ගැනුම් ගිණුම.

(3) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජ'නලය. (4) ජ'නල් වවුචරය, පොදු ජ'නලය.

32. මූලාශ්‍ර ලේඛනයක ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) ගනුදෙනුවට අදාළ ආරම්භක ලියවිල්ලක් ලෙස යොදා ගත හැකි වීම.

(2) වගකීම නිශ්චිතව පැවරිය හැකි වීම.

(3) භාණ්ඩයේ කල් ඉකුත් වීමේ දිනය දැනගත හැකි වීම.

(4) ගනුදෙනු මූලික සටහන් පොත් වල ලිවීමේ දී යොදාගත හැකි වීම.

33. වෙළඳ භාණ්ඩ ණයට විකිණීම සටහන් කරන මූලික සටහන් පොත වන්නේ,

(1) විකුණුම් ඉන්වොයිසිය. (2) විකුණුම් ජ'නලය. (3) පොදු ජ'නලය. (4) ජ'නල් වවුචරය.

34. ව්‍යාපාරයක සුළු මුදලින් ගෙවීම් සිදු කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) සුළු මුදල් පොත, ලදු පත. (2) ලදු පත, සුළු මුදල් පොත.

(3) සුළු මුදල් ගෙවීම් වවුචරය, සුළු මුදල් පොත. (4) සුළු මුදල් පොත, සුළු මුදල් ගෙවීම් වවුචරය.

35. ව්‍යාපාරයක මුදලින් සිදුවන මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් වාර්තා කරන මූලික සටහන් පොත,

(1) ලදු පත. (2) මුදල් පොත. (3) ගෙවීම් වවුචරය. (4) පිළිපත.

36. මුදල් පොතක ද්විත්ව කාර්යය වන්නේ,

(1) මූලික සටහන් පොතක හා මූලාශ්‍ර ලේඛනයක කාර්යය.

(2) මූලාශ්‍ර ලේඛනයක හා ගිණුම් ලිපිකරුගේ කාර්යය.

(3) ලෙජර් ගිණුමක කාර්යය හා මූලාශ්‍ර ලේඛනයක කාර්යයි.

(4) ලෙජර් ගිණුමක කාර්යය හා මූලික සටහන් පොතක කාර්යය.

37. ව්‍යාපාරයක මුදල් ලැබීම හා සම්බන්ධ ගනුදෙනුවක් නොවන්නේ,

(1) අත්පිට ගැනුම් (2) අත්පිට විකුණුම් (3) ප්‍රාග්ධනය යෙදීම (4) බැංකුණය ලබා ගැනීම

- **පහත 38, 39, 40 ප්‍රශ්න සඳහා පහත සඳහන් සිද්ධිය ඇසුරින් පිළිතුරු සපයන්න.**

ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ටෙක්ලා මහත්මිය රු. 80 000 ක රෙදි තොගයක් ''අමිල ටෙක්ස්'' වෙතින් ණයට ලබා ගන්නා ලදී. එම ණය මුදල් චෙක් පතකින් පිය වූ අතර එහිදී ඇයට 10% ක වට්ටමක් ලැබුණි.

38. 10% වට්ටම ටෙක්ලා මහත්මියගේ

(1) දුන් වට්ටමකි. (2) වෙළඳ වට්ටමකි. (3) ලද වට්ටමකි. (4) පරිත්‍යාගයකි.

39. ඉහත වට්ටමක් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,

(1) ණය හිමි ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර (2) දුන් වට්ටම් ගිණුම හර, ණයගැති ගිණුම බැර

(3) ණයගැති ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර (4) ලද වට්ටම් ගිණුම හර, ණයහිමි ගිණුම බැර

40. චෙක්පතකින් ණය පියවීමට අදාළ මූලික සටහන් පොත වනුයේ,

(1) මුදල් පොත (2) ණය හිමි ගිණුම (3) ණය ගැති ගිණුම (4) බැංකු ගිණුම

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

වැදගත් :

- පළමු ප්‍රශ්නයටත් I කොටසින් ප්‍රශ්න දෙකක්ද,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ගම්මිරිස් වගාව හා වෙළඳාම පිළිබඳ ගොවිජන සේවා මධ්‍යස්ථානය හරහා මෙහෙයවන ලද පාඨමාලාවක් හදාරා ඇති සදෙව් තම ප්‍රදේශයේ බහුලව නිෂ්පාදනය කරන ගම්මිරිස් මිලදීගෙන විකිණීමේ ව්‍යාපාරයක් ''සඳු ප්‍රඩක්ට්ස්'' නමින් 2023 /08 /01 දින ආරම්භකරන ලදී. ගම්මිරිස් පැකැට් කර සිල්ලර වෙළඳසැල් හරහා අලෙවි කරන අතර ව්‍යාපාරයට සේවකයෙකු ද බඳවා ගන්නා ලදී.

ආරම්භ ප්‍රාග්ධනය ලෙස තම පියාගෙන් ලද රු. 500 000/= ක මුදල හා රු 1100 000/= ක් වටිනා කුඩා ලොරි රථයක් ද යොදවා ඇත. මුදල් පොතට අමතරව සුළු මුදල් පොතක් ද පවත්වාගෙන යාමට අදහස් කළ සදෙව් මාසික සුළු මුදල් අග්‍රිමය ලෙස රු. 4000/= ක මුදලක් වෙන්කිරීමට ද, රු. 1000/= ට අඩු වියදම් සුළු මුදල් වියදම් ලෙස ද තීරණය කරන ලදී.

2023 /8 / 31 න් අවසන් වූ මාසය තුළදී පහත ගනුදෙනු සිදු වී ඇත.

8/ 1	-	ගම්මිරිස් මිලදී ගැනීම රු. 25000/=
8/2	-	රු. 50 000/= ක් යොදා බැංකුවේ ගිණුමක් ආරම්භ කිරීම
8/5	-	ඉන්ධන සඳහා වියදම් රු. 8000/
8/8	-	ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 7000/=
8/12	-	ගම්මිරිස් විකිණීම රු. 15000/=
8/15	-	ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම රු. 700/=
8/16	-	තැපැල් වියදම් - රු. 800/=
8/18	-	ගම්මිරිස් විකුණුම් රු. 20 000/=
8/25	-	සේවක වැටුප් රු. 18 000/=
8/28	-	ගම්මිරිස් ණයට ගැනුම් රු. 12 000/=

ඉදිරියේ දී තමාගේම ගම්මිරිස් වගාවක් ඇරඹීමට අපේක්ෂාවෙන් සිටින සදෙව් 2023 /9 / 2 දින රු. 1 000 000/= ක බැංකුණයක් ලබා ගන්නා ලදී.

(i) (අ) මෙම ව්‍යාපාරය හරහා ඉටු කෙරෙන මිනිස් අවශ්‍යතාව කුමක් ද? (ල. 01)

(ආ) මෙම ව්‍යාපාරයේ ශක්තියක් ලියා දක්වන්න. (ල. 01)

(ii) සිද්ධිය ඇසුරින් නිෂ්පාදන සාධක 2 ක් දක්වා නිදසුන බැගින් ලියා දක්වන්න. (ල. 02)

(iii) (අ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් 02 ක් ලියා දක්වන්න. (ල. 01)

(ආ) එම එක් පාර්ශවයක් එසේ ඇල්මක් දැක්වීමට හේතු 02 ක් සඳහන් කරන්න. (ල. 01)

(iv) (අ) හිමිකාරිත්වය අනුව ''සඳු ප්‍රඩක්ට්ස්'' කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද? (ල. 01)

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි 02 ක් සඳහන් කරන්න. (ල. 01)

(v) (අ) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතු වන නීතිමය පසුබිම ලියා දක්වන්න. (ල. 01)

(ආ) ව්‍යාපාරය ලියාපදිංචිය සඳහා අවශ්‍ය ඉල්ලුම් පත්‍රය ලබා ගන්නේ කිනම් ස්ථානයකින් ද? (ල. 01)

(vi) මෙම ව්‍යාපාරයේ ආරම්භක ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියා දක්වන්න. (ල. 02)

(vii) (අ) 2023/8/28 ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(ආ) එම ගනුදෙනුව ගිණුම්ගත කර දක්වන්න. (ල. 02)

(viii) (අ) මෙහි දැක්වෙන සුළු මුදල් පොතෙහි දැක්විය යුතු වියදම් මොනවාද?

(ආ) 2023/9/1 දින අග්‍රිමය ප්‍රතිපූර්ණය ලෙස වෙන් කළ යුතු මුදල කොපමණ ද? (ල. 02)

(ix) (අ) 2023 / 09 / 02 දින බැංකු ණය ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 01)

(ආ) එම ගනුදෙනුව ගිණුම් ගත කොට දක්වන්න. (ල. 01)

(x) මෙම ව්‍යාපාරයෙ 2023 / 08/ 31 න් අවසන් මාසය සඳහා මුදල් ශේෂය ගණනය කොට දක්වන්න. (ල. 02)

I කොටස- ව්‍යාපාර අධ්‍යයනය

(02) (i) මිනිසාගේ පැවැත්ම සමාජයීය වශයෙන් දියුණු වන විට අවශ්‍යතා හා වුවමනා පුළුල් වේ.

(අ) අවශ්‍යතා යන්න නිර්වචනය කරන්න.

(ආ) මූලික අවශ්‍යතා 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) මිනිසා වර්තමානයේ අවශ්‍ය සියලුම දෑ තමා විසින්ම නිෂ්පාදනය කර ගනියි. (..............)

(ආ) ලාභ අපේක්ෂාවෙන් පමණක් ව්‍යාපාර කටයුතු කරයි. (.............)

(ඉ) භාණ්ඩ අතිරික්තය නිසා භාණ්ඩ හුවමාරු ක්‍රමය ඇති විය. (.............)

(ඊ) නිෂ්පාදකයෝ ද, පාරිභෝගිකයෝ වෙති. (.............)

(ල. 02)

(iii) සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරන්නේ යම් සුවිශේෂී අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටු කර ගැනීමට අපේක්ෂාවෙනි.

(අ) ලාභ අපේක්ෂිත ව්‍යාපාර වල පොදුවේ දැකිය හැකි අරමුණු 02 ක් ලියන්න.

(ආ) මෙම අරමුණු ඉටු කර ගැනීමේ දී ව්‍යාපාරයකට උප අරමුණු අවශ්‍ය වේ. එවැනි උප අරමුණු 02 ක් ලියන්න. (ල. 02)

(iv) වෘත්තීය පුහුණුවක් ලබා ඇති අකීසා තමාගේම ව්‍යාපාරයක් ලෙස රූපලාවන්‍යාගාරයක් ආරම්භ කරන ලදී.

(අ) නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කිරීමේ දී අකීසාගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාරයක් ද?

(ආ) ඉහත ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන් 02 ක් ලියන්න. (ල. 02)

(03) (i) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපාර වලට විවිධ සම්පත් අවශ්‍ය වේ.

(ආ) නිෂ්පාදන සාධක 02 ක් ලියන්න.

(ආ) ව්‍යාපාර පරිසරය යනු කුමක් ද? (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සාර්ථක ව්‍යාපාර නිරතුරුවම ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කරයි. (...........)

(ආ) කළමනාකරුවෝ ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වේ. (...........)

(ඉ) ගනුදෙනුකරුවෝ ව්‍යාපාරයක බාහිර පරිසරයට අයත් නොවේ. (..........)

(ඊ) සැපයුම්කරුවෝ ව්‍යාපාර බාහිර පරිසරයට අයත් වේ. (..........)

(iii) රජය විසින් නව විද්‍යුත් දුම්රිය සේවාවන් ආරම්භ කිරීමටත්, ඒ සඳහා ආයෝජනය කරන විදෙස් රටවල් ආයෝජකයන්ට නව නීතිරීති හඳුන්වා දීමට අදහස් කරයි.

(අ) ඉහත සිද්ධියේ සඳහන් වන ව්‍යාපාර බාහිර පරිසරයට අයත් සාධක 02 ක් ලියන්න.

(ආ) නම් කරන ලද සාධක දෙක සඳහා නිදසුන බැගින් ලියන්න. (ල. 02)

(iv) (අ) ආර්ථික පරිසරය යනු කුමක් ද?

(ආ) ආර්ථික පරිසරය සඳහා බලපාන ආර්ථික සාධක 2 ක් ලියන්න. (ල. 02)

(04) (i) හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1000/= ක් හෝ ඊට වැඩි නම් ලිඛිත ගිවිසුමක් අනුව හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යා යුතුය.

(අ) ඉහත ලිඛිත ගිවිසුම හඳුන්වන නම කුමක් ද?

(ආ) මෙම කරුණ පිළිබඳ සඳහන් කර ඇති හවුල් ව්‍යාපාර සඳහා බලපාන නීතිය කුමක් ද? (ල. 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර දින 14 ක් ඇතුළත් ලියා පදිංචිය කළ යුතුය. (..........)

(ආ) රාජ්‍ය දෙපාර්තමේන්තුවල අයිතිය හා පාලනය රජය සතු වේ. (..........)

(ඉ) පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑම අවම කිරීම සඳහා සමුපකාර පිහිටුවා ඇත. (..........)

(ඊ) 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව හවුල් ව්‍යාපාරයක උපරිම හවුල්කරුවන් ගණන අසීමිතය. (..........)

(ල. 02)

(iii) අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින් රජයේ ඍජු පාලනයට යටත් වන, බොහෝ විට මහජනතාවට සේවා සැපයීමට ක්‍රියාත්මක වන සංවිධාන දැකිය හැක.

(අ) මෙවැනි සංවිධාන හඳුන්වන නම කුමක් ද?

(ආ) එම සංවිධාන වල දැකිය හැකි අවාසියක් ලියන්න. (ල. 02)

(iv) තරිඳු තම පාසල් අධ්‍යාපනය නිම වූ පසු මුරුක්කු නිෂ්පාදන ව්‍යාපාරයක් ''සුමිහිරි බයිට්ස්'' නමින් ආරම්භ කරන ලදී.

(අ) ''සුමිහිරි බයිට්ස්'' ලියාපදිංචි කළ යුතුද? ලියාපදිංචිය සඳහා බලපාන නීතිය කුමක් ද?

(ආ) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම මගින් තරිඳුට ලැබෙන වාසි 02 ක් සඳහන් කරන්න. (ල. 02)

II කොටස- ගිණුම්කරණය

(05) (i) ව්‍යාපාරයක පවතින වත්කම් ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදිය හැකිය. එම වර්ග 02 නම් කර උදාහරණය බැගින් ලියන්න. (ල. 02)

(ii) ''පබසරා හාඩ්වෙයාර්'' ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ මුල් සතිය තුළ පහත ගනුදෙනු සිදු වී ඇත.

2023/01/02 රු. 100 000 ට මිලදී ගත් සිමෙන්ති තොගයක් රු. 120 000 ට ණයට විකිණීම.

2023/01/03 ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම රු. 50 000/=

2023/01/04 ව්‍යාපාරයේ විදුලි වියදම රු. 5000/=

2023/01/06 රු. 25 000/= බැංකු ණය වාරිකය ගෙවීම. (මෙහි ඇතුළත් බැංකු ණය පොලිය 5000 කි.)

පබසරා හාඩ්වෙයාර් ව්‍යාපාරයේ ජනවාරි මුල් සතියේ සිදු වූ ගනුදෙනු පහත සමීකරණය තුළ ගලපන්න.

	තොගය	+ණයගැතියෝ	+ මුදල් =	හිමිකම්	+බැංකු ණය	+ණයහිමියෝ
ආරම්භක ශේෂ	500 000	+100 000	+50 000 =	330 000	+ 200 000	+120 000

(ල 04)

(iii) පහත සඳහන් ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(අ) අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු. 10 000/= මුදලක් ගැනීම. (ල. 02)

(iv) අමාෂාගේ ව්‍යාපාරයේ 2023 පෙබරවාරි මාසයේ මුල් සතිය තුළ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට සිදු වූ බලපෑම පහත දැක්වේ. (මෙම සතිය තුලදී භාණ්ඩ හෝ මුදල් ගැනිලි සිදු වී නොමැත)

	ලීබඩු උපකරණ	+තොගය	+ණයගැතියෝ	+මුදල්	= හිමිකම්	+ණයහිමියෝ
ආරම්භක ශේෂ	350 000	+100 000	+25 000	+75 000	= 425 000	+125 000
2023/02/01		-10 000			- 10 000	
2023/02/03	+50 000			- 50 000		
2023/02/04		-50 000	+75 000		+ 25 000	
2023/02/05				- 25 000		- 25 000

ඉහත බලපෑම්වලට අදාල ගනුදෙනුව ලියා දක්වන්න. (ල. 04)

06. (i) මූලාශ්‍ර ලේඛනයක තිබිය යුතු මූලික තොරතුරු දෙකක් ලියන්න. (ල. 02)

(ii) මුදල් පොතක ගනුදෙනු සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන් මූලධර්මය කුමක් ද? (ල. 02)

(iii) සසංකගේ ව්‍යාපාරයේ 2023/05/01 මුදල් පොතේ හර ශේෂය රු. 150 000/= ක් වූ අතර මැයි මස මුල් සතිය තුළ සිදු වූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

(අ) 2023/05/02 ලදුපත් අංක 01 - සසංක අමතර ප්‍රාග්ධනය ලෙස රු. 50 000/= ක් ව්‍යාපාරයට යෙදවීය.

(ආ) 2023/05/04 වවුචර් අංක 101 බඩු තොගයක් අත්පිට ගැනුම් රු. 75000/=

(ඉ) 2023/05/06 වවුචර් අංක 102 - ණය හිමියෙකු වන අසංකට රු. 30 000/= ක් ගෙවීය.

(ඊ) 2023/05/06 ලදුපත් අංක 57 රු. 125 000/= ක බැංකු ණයක් ලබා ගැනීම.

අවශ්‍ය වන්නේ,

(අ) 2023/05/07 දිනට මුදල් පොත පිළියෙල කර ශේෂය ගණනය කිරීම. (ල. 04)

(ආ) එම ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම. (ල. 04)

07. (i) බැංකු ගිණුම අයත් වන ගිණුම් වර්ගය කුමක් ද? (ල. 02)

(ii) බැංකු ගිණුමක ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන 02 ක් ලියන්න. (ල. 02)

(iii) රෝස්ගේ ව්‍යාපාරයේ 2023 අගෝස්තු මස මුල් සතිය තුල සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

(a) 2023/8/1 බැංකු ශේෂය රු. 350 000/=.

(b) 2023/8/2 ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය රු. 50 000/= චෙක්පතකින් ගෙවීම.

(c) 2023/8/4 බැංකුවෙන් රු. 100 000/= ක් ආපසු ගැනීම.

(d) 2023/8/5 ණය ගැතියෙකු වූ කපිලගෙන් ලද රු. 75 000/= ක චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කිරීම.

අවශ්‍ය වන්නේ,

(අ) බැංකු ගිණුම පිළියෙළ කර ශේෂය සෙවීම.

(ආ) ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම.

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(4)	2 -(2)	3 -(3)	4 -(4)	5 -(3)	6 -(1)	7 -(2)	8 -(3)	9 -(4)	10 -(1)
11-(2)	12 -(3)	13 -(4)	14 -(1)	15 -(4)	16 -(2)	17 -(3)	18 -(3)	19 -(4)	20 -(4)
21-(4)	22 -(3)	23 -(2)	24 -(2)	25 -(2)	26 -(3)	27 -(1)	28 -(1)	29 -(2)	30 -(1)
31-(3)	32 -(3)	33 -(2)	34 -(3)	35 -(2)	36 -(4)	37 -(1)	38 -(3)	39 -(1)	40 -(4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II පත්‍රය

01. (i) (අ) ආහාර

(ආ) - ගොවිජන සේවා මධ්‍යස්ථානය හරහා සදෙව් හදාරා ඇති පාඨමාලාව

- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම. (ල. 02)

(ii) ශ්‍රමය - සේවකයා

ප්‍රාග්ධනය - ලොරි රථය, රු. 500 000 ක මුදල　　ව්‍යවසාය - අයිතිකරු සදෙව් දැනුම (ල. 02)

(iii) (අ) අයිතිකරු (සදෙව්), සේවකයා, සැපයුම්කරුවන්, මූල්‍ය ආයතන

(ආ) සපයා ඇති පිළිතුර අනුව නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 02)

(iv) (අ) ඒක පුද්ගල/තනි පුද්ගල / කේවල ස්වාමි ව්‍යාපාර

(ආ) ● පහසුවෙන් ආරම්භ කළ හැකි වීම. ● සියලුම ලාභ අයිතිකරු සතු වීම. ● තොරතුරු වල රහස්‍යබව. ● තීරණ ගැනීමේ ස්වාධීන බව. ● තම දක්ෂතා උපරිමව යෙදිය හැකි වීම. (ල. 02)

(v) (අ) තනි පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යයි. නම් අදාළ පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුය.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් (ල. 02)

(vi)

		වත්කම්	=	හිමිකම්	+	වගකීම්	
මෝටර් රථ	+	මුදල්	=	ප්‍රාග්ධනය			
1 100 000	+	500 000	=	1600 000	+	-	(ල. 02)

(vii) (අ) ගැනුම් ගිණුම - හර 12 000

ණය හිමියෝ - බැර 12 000 (ල. 01)

(ආ)

ගැනුම් ගිණුම

හර		බැර	
8/28 ණයහිමියෝ	12 000		

ණය හිමියෝ

හර		බැර	
		8/28 ගැනුම්	12 000

(ල. 01)

(viii) (අ) ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම රු. 700/=

තැපැල් විදයම් රු. 800/=

(ආ) රු. 2 500/= (ල. 02)

(ix) (අ) මුදල් පොත - හර 1 000 000

බැංකු ණය - බැර 1 000 000 (ල. 01)

(ආ)

මුදල් පොත

හර	බැර
9/2 බැංකු ණය 1 000, 000	

බැංකු ණය ගිණුම

හර	බැර
	9/2 මුදල් 1 000, 000

(ල. 01)

(x) මුදල් පොත

½ 8/1 ප්‍රාග්ධනය	500, 000	8/1 සුළු මුදල්	4 000 → ½
8/12 විකුණුම්	15, 000	8/1 ගැනුම්	25 000
8/18 විකුණුම්	20, 000	8/2 බැංකු	50 000
		8/5 ඉන්ධන	8 000 ½
		8/8 ඇසුරුම් ද්‍රව්‍ය	7 000
		8/25 වැටුප්	18 000
		8/31 ප/ගෙ ශේෂය	4 23 000 → ½
	535, 000		535, 000

(ල. 02)

(මුදල් ශේෂය නිවැරදිය ගණනය කොට ඇත්නම් අදාළ ලකුණු ලබාදෙන්න.)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(02) (i) (අ) ජීවත් වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දෑ,

(ආ) ආහාර පාන, නිවාස, ඇඳුම් පැළඳුම්, සෞඛ්‍ය, අධ්‍යාපනය, ආරක්ෂාව. (ල. 02)

(ii) (අ) අසත්‍ය (ආ) අසත්‍ය (ඉ) සත්‍ය (ඊ) සත්‍ය (ල. 02)

(iii) (අ) ලාභ ඉපයීම, පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම.

(ආ) භාණ්ඩ හා සේවා වල ගුණත්වය ඉහළ නැංවීම, රැකියා උත්පාදනය, සේවක සුභසාධනය. (ල. 02)

(iv) (අ) සේවා සැපයීමේ ව්‍යාපාර

(ආ) අයිතිකරු (අකීසා), ගනුදෙනුකරුවෝ, ප්‍රජාව, තරඟ කරුවෝ. (ල. 02)

(03) (i) (අ) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය

(ආ) ව්‍යාපාර කටයුතු පවත්වගෙන යාමේ දී ඊට බලපෑම් කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව.(ල. 02)

(ii) (ආ) සත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය (ල. 02)

(iii) (අ) දේශපාලන පරිසරය, නෛතික පරිසරය. (ල. 01)

(ආ) දේශපාලන පරිසරය ⟶ යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති, අයවැය ප්‍රතිපත්ති.

නෛතික පරිසරය ⟶ 2007 අංක 07 දරන සමාගම් පනත. (ල. 02)

(iv) (අ) ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික සාධක ඇතුළත් පරිසරය.

(ආ) පොලී අනුපාතය, උද්ධමනය ආදායම් ව්‍යාප්තිය, රැකියා නියුක්තිය, ජාත්‍යන්තර සබඳතා, විදේශ විනිමය අනුපාතය, ඉතුරුම්. (ල. 02)

04. (i) (අ) හවුල් ඔප්පුව

(ආ) වංචා වැලැක්වීමේ ආඥා පනත. (ල. 02)

(ii) (අ) සත්‍යයි (ආ) සත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) අසත්‍ය යි. (ල. 02)

(iii) (අ) රාජ්‍ය දෙපාර්තුමේන්තු (ආ) නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ල. 02)

(iv) (අ) • ඔව් • ව්‍යාපාර නාම ආඥා පනත

(ආ) • අනන්‍යතාවක් ලැබීම. • ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම. • රජයෙන් ලබාදෙන දිරිගැන්වීම් ලැබීමට සුදුසුකමක් වීම. • ණය ලබාගැනීමේ දී පහසුව. (ල. 02)

II කොටස - ගිණුම්කරණය

05. (i) ජංගම වත්කම් - උදා:- මුදල්, බැංකු, ණයගැතියෝ, තොගය

ජංගම නොවන වත්කම් - උදා :- ඉඩම් ගොඩනැගිලි, මෝටර් රථ, ලී බඩු උපකරණ, යන්ත්‍ර සූත්‍ර (ල. 02)

	තොගය	+ණයගැතියෝ	+ මුදල්	= හිමිකම්	+ බැංකුණය	+ ණයහිමියෝ
ආරම්භක ශේෂ	500 000	+100 000	+ 50 000	=330 000	+200 000	+120 000
2023/1/2	- 100 000	+120 000		+20 000		
2023/1/3		- 50 000	+ 50 000			
2023/1/4			- 5 000	- 5 000		
2023/1/5			- 25 000	- 5 000	- 20 000	

(ල. 04)

(05) (iii) ගැනිලි ගිණුම - හර 10 000
මුදල් ගිණුම - බැර 10 000 (ල. 02)

(iv) 2023/02/01 රු. 10 000/= තොග හානි සිදු වීම.
2023/02/03 රු. 50 000/= කුලී බඩු උපකරණ මිලට ගැනීම.
2023/02/04 රු. 50 000/= පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 75 000 ට ණයට විකිණීම.
2023/02/05 රු. 25 000 ක් ණය හිමියන්ට ගෙවීම. (ල. 04)

06. (i) ව්‍යාපාරයේ නම හා ලිපිනය, අනුක්‍රමික අංකය, ගනුදෙනුව සිදුවූ දිනය, ගනුදෙනුවට සම්බන්ධ අනෙක් පාර්ශවය යන විස්තර, ගනුදෙනුවේ මූල්‍යමය වටිනාකම, වගකීම භාර ගන්නා නිලධාරියෙකුගේ අත්සන. (ල. 02)

(ii) වත්කම් වැඩිවීම - හර, වත්කම් අඩු වීම - බැර. (ල. 02)

(iii) (අ)

හර — මුදල් පොත — බැර

දිනය	ලඅ	විස්තරය	සපි	වටිනාකම	දිනය	වඅ	විස්තරය	සපි	වටිනාකම
2023									
5/1		ඉ/ගෙ ශේෂය		150 000	5/4		ගැනුම්		75 000
5/2	01	ප්‍රාග්ධනය		50 000	5/6		ණයහිමි - අසංක		30 000
5/6	57	බැංකු ණය		125 000	5/7		ශේෂය ප/ගෙ		215 000
				325 000					325 000
5/8		ශේෂය ඉ/ගෙ		215 000					

(ල. 04)

(ආ)

ප්‍රාග්ධන ගිණුම

	5/2 මුදල් 50 000

බැංකුණය ගිණුම

	5/6 මුදල් 125 000

ගැනුම් ගිණුම

5/4 මුදල් 75 000	

ණයහිමි (අසංක) ගිණුම

5/6 මුදල් 30 000	

(ල. 04)

07. (i) වත්කම් ගිණුම. (ල. 02)

(ii) තැන්පත් කිරීමේ කුවිතාන්සි ගෙවීම් වවුචර, බැංකු ප්‍රකාශ, අගරුචෙක්පත් දැනුම් දීමේ ප්‍රකාශ. (ල. 02)

(iii)

බැංකු ගිණුම

හර | බැර

දිනය	ලඅ	විස්තරය	සපි	වටිනාකම	දිනය	වඅ	විස්තරය	සපි	වටිනාකම
2023									
8/1		ඉ/ගෙ ශේෂය		350 000	8/2		රක්ෂණ		50 000
8/4		ප්‍රාග්ධනය		70 000	8/4		මුදල්		100 000
		බැංකු ණය			8/5		ශේෂය ප/ගෙ		275 000
				425 000					425 000
8/6		ශේෂය ඉ/ගෙ		275 000					

(ල. 04)

(ආ)

රක්ෂණ ගාස්තු

8/2 බැංකු 50 000	

ණයගැති (කපිල)

	8/4 බැංකු 75 000

මුදල් පොත

8/4 බැංකු 100 000	

(ල. 04)